කැකිරාව ප්‍රදේශයේ සිසුවෙකුට කොන්දොස්තරවරයෙකු විසින් පහර දුන් බවට පැවසෙන සිදුවීමක්, මාධ්‍ය අවධානයට හසුව තිබිණි.
මෙම සිදුවීම වාර්තා කරනා දිනමිණ පුවත්පත, අදාළ පහර කෑ බවට පැවසෙන සිසුවාගේ ඡායාරූපය, අනන්‍යතාව සැඟවීමකින් තොරව පළ කොට තිබිණි. එසේම සිසුවාගේ නම ද සඳහන් කොට තිබිණි.
සිදුවීම වාර්තා කරනා අද සහ අරුණ පුවත්පත්, එම සිසුවාගේ ඡායාරූපයෙ ඇස් වසා, අනන්‍යතාවය සැඟවීමට උත්සුක වෙමින් පළ කර තිබිණි. නමුත් සිසුවාගේ නම මෙම පුවත්පත් දෙකෙහිම පළ වී තිබිණි.
බාලවයස්කරුවන්ට සිය පාසල් සමය අනවශ්‍ය අතපෙවීම් වලින් තොරව සම්පූර්ණ කරගන්නට නිදහස තිබිය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම පවසයි. එසේම, බාලයන්ව අවධානමක හෙළන ආකාරයේ කිසිදු තොරතුරක් හෝ ඡායාරූපයක් ප්‍රසිද්ධ කිරීමෙන් වළකින ලෙස යුනිසෙෆ් මාර්ගෝපදේශයන් පවසයි.
1) ඔබේ අදහසට අනුව, මෙම පුවත්පත් මෙම දරුවාගේ අනන්‍යතාවය සැඟවීමකින් තොරව පළ කොට තිබීම ගැටළුකාරී නොවන්නේ ද?
2) එය එම දරුවාගේ පාසල් අධ්‍යාපනයට බාධා ඇති කරනු ඇතැයි ඔබ නොසිතන්නේ ද?
මූලාශ්‍ර:
https://www.unicef.org/eca/media/ethical-guidelines
https://www.editorscode.org.uk/the_code.php
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

